දිල්රුක්ෂි

ඔස්ට්‍රේලියාවේ ප්‍රධාන ධාරාවට අයත් මාධ්‍යයක් වන SBS (Special Broadcasting Service) ආයතනයේ සිංහල වැඩසටහන මෙරට සෑම ප්‍රාන්තයකටම ශ්‍රවණය වන ජාතික තලයේ එකම සිංහල ගුවන් විදුලි වැඩසටහනයි. එහි සිංහල අංශ ප්‍රධානී තනතුර යනු සෑහෙන වගකීම් සම්භාරයක් පැවරෙන තනතුරක් වන අතර එය රාජ්‍ය මාධ්‍යයක් වන බැවින් භාරදූර ක්‍රියා පටිපාටියක් අනුගමනය කරනු ලබන ආයතනයක් ද වේ. එම තනතුරට පත් වූ ප්‍රථම ශ්‍රී ලාංකික කාන්තාව සේම එම තනතුර හොබවන ප්‍රථම ශ්‍රී ලාංකික මාධ්‍යවේදිනිය වන්නේද දිනේෂා දිල්රුක්ෂි විජේසූරියයි.ඇය ශ්‍රී ලංකාවේ සහ ඔස්ට්‍රේලායාවේ ගෙවුණු දශක දෙකකට වැඩි ඇගේ මාධ්‍ය ජීවිතය පිළිබඳව "සන්නස" පුවත්පතට හෙළිකළ තොරතුරු ඇසුරින් මෙම ලිපිය සකස් වී තිබේ.

සන්නසඃ
ඔබ SBS ගුවන් විදුලි සේවය සමඟ සම්බන්ධ වූයේ කවර කාලයකද?
දිල්රුක්ෂිඃ
2013 වසරේදී ,එම ගුවන්විදුලි ආයතනයේ වැඩසටහන් වල සිදු වූ දැවැන්ත ප්‍රතිසංශෝධන සමගයි. ඊට පදනම වැටුණු ආකාරය විස්තර කිරීම මෙහිදී වැදගත් යැයි මා විශ්වාස කරනවා. ඔස්ට්‍රේලියාවේ 2011 වසරේදී පැවැත්වුණ ජනසංගනනයට අනුව මෙරටට සංක්‍රමණය වුණු සංක්‍රමණිකයන්ගේ ජන අනුපාතය වෙනස් වී තිබෙන අන්දම ඔස්ට්‍රේලියානු මධ්‍යම රජය විසින් විශ්ලේෂණය කර බැලීමේදී ඉංගිරිසි භාෂාව මව්භාෂාව නොවන ජාතිකයින් විශාල ප්‍රමාණයක් විවිධ හේතු මත මෙරටට සංක්‍රමණය වී තිබෙන බව හෙළි වෙනවා. මේ නිසා ඔවුන්ගේ මව් භාෂාවෙන් කාලීන තොරතුරු සම්ප්‍රේෂණය කිරීමේ වැදගත්කම ඉස්මතු වුණා. ඊට පිළියමක් ලෙස SBS ගුවන් විදුලි නාලිකාවේ භාෂා වැඩසටහන් සියල්ලේම සංයුතිය නැවත ප්‍රතිසංවිධානය කිරීමේ අවශ්‍යතාව තදින් මතුවුණා. එම ව්‍යාපෘතිය 2013 වසරේදී දියත් කෙරුණ අතර එය වසර විසිපහක් වැනි දීර්ග කාලයකට පසුව මෙම ගුවන් විදුලි නාලිකාව තුළ ඇති වූ විශාල ප්‍රතිසංවිධානයක්. ඒ අනුව ජන අනුපාතය සහ ඔවුන්ගේ භාෂා අවශ්‍යතාව මත ඒ ඒ භාෂාව වෙනුවෙන් ගුවන් විදුලි කාලයක් වෙන් කෙරුණා.ඒ අනුව සිංහල භාෂාව වෙනුවෙන් සතියකට පැය හතරක කාලයක් හිමි වුණා. එසේම අළුතින් නිලධාරින් බඳවාගැනීමේ අවශ්‍යතාව පැන නැගුණ නිසා ඔස්ට්‍රේලියානු රජය විසින් එම තනතුරු ගැසට් පත්‍රයේ පලකරනු ලැබුවා. ඒ අනුව තෝරාගැනීමේ පරික්ෂණයෙන් සමත් වී SBS ගුවන් විදුලියේ සිංහල වැඩසටහන් අංශයේ අංශ ප්‍රධානි ලෙස 2013 වසරේ මම පත්වීම භාරගත්තා.

සන්නසඃ
SBS ආයතනයට සම්බන්ධ විමට පෙර ඔබ ශ්‍රී ලංකාවේ ලක්හඬ ගුවන් විදුලි සේවයේ දශකයට වැඩි කාලයක් සේවය කළා. ඔබේ ගුවන් විදුලි මාධ්‍ය ජීවිතය ආරම්භය කොතැනද?
දිල්රුක්ෂිඃ
මගේ ගුවන් විදුලි ජීවිතයේ ආරම්භය ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ළමා පිටිය. එකළ මා පාසල් යන කුඩා දැරියක්. මගේ මව්පියන් දෙපළම වෘත්තියෙන් විදුහල්පතිවරුන්. මගේ පියානන් වන චන්ද්‍රසේන විජේසූරිය කලාවට මහත් ලැදි කමක් දැක්වූ අයෙක්. ඔහු පුවත් පත් සඳහා ලිපි සම්පාදනය කළා වේදිකා නාට්‍ය රචනා කළා වගේම නිෂ්පාදනය කළා සුභාවිත ගීතය සම්පව ඇසුරු කළා. මේ නිසා අප තුළත් කුඩා කළ පටන් කලාව සහ සාහිත්‍ය කෙරෙහි විශාල නැඹුරුවක් තිබුණා. ගුවන් විදුලියේ ළමා පිටියට ශිල්පීන් බඳවා ගැනීමේ පරික්ෂණයට අපව ඉදිරිපත් කළේ මගේ පියා. එහි හඬ පරීක්ෂණයෙන් මමත් මගේ නැගණිය මෝක්ෂා විජේසූරියත් සමත් වුණා. එකළ ළමා පිටියේ අපව පුහුණු කළේ සුමනා ජයතිලක නැන්දා (කේ .ජයතිලකයන්ගේ බිරිඳ) සහ මහින්ද අල්ගම මාමා. ඔවුන් අප තුළ සැඟව තිබූ කුසලතාව ඉස්මතු කළා පමණක් නොවේ අපව විනයගරුක ගුවන් විදුලි ශිල්පීන් ලෙස සමාජයට මුදාහැරීමේ වගකීම වෙනුවෙන් සදා ඇපකැප වුණා. මගේ පාසල වුණේ කිරිබත්ගොඩ විහාර මහාදේවි බාලිකා විද්‍යාලය. පාසල් ඇරී අප එන්නේ එකල ළමා පිටියට. එදා අප පාසල් නිල ඇඳුමෙන් ගුවන් විදුලි සංස්ථා පරිශ්‍රය තුළ කෙතරම් සැරිසරන්නට ඇත්ද. ගුවන් විදුලි ශිල්පියකු සතු විය යුතු වැඩ සටහන් ඉදිරිපත් කිරීමේ හැකියාවට අමතරව තාක්ෂණික මෙවලම් පරිහරණය සහ වැඩසටහන අතරතුර පාලන මැදිරිය සමඟ සංඥා භාවිතයෙන් නිවැරදිව සන්නිවේදනය කරන ආකාරය පිළිබඳව පවා අපට නිවැරදි පුහුණුවක් ලැබුණ නිසා විශාල ආත්ම විශ්වාසයකින් යුතුව තම කාර්යයයේ නියැලීමේ පරිචය අප තුළ නිසැකවම ගොඩනැගුණා. එකළ මා සමඟ ළමා පිටියේ සිටි ශිල්පීන් බොහොමයක් අදටත් මාධ්‍ය ලෝකය තුළ සාර්ථක ගමනක නියැළෙනවා. ඔවුන් අතරින් සුදේව හෙට්ටිආරච්චි අරවින්ද ලොකුගේ සහ ලක්මාලි වෙළගෙදර මගේ මතකයට නිතැතින්ම එන සමීප චරිත කිහිපයක්.

එක්තරා අවස්ථාවක ගුවන් විදුලි සංස්ථාව තුළ කතිකාවක් ගොඩනැගෙනවා ළමා පිටියේ පුහුණුවන ශිල්පීන්ට සජීවිව වැඩසටහන් ඉදිරිපත් කිරීමේ අවස්ථාව ලබාදිය යුතුයි කියා. ඒ වනවිට ළමා පිටියේ වැඩසටහන් ඉදිරිපත් කෙරුණේ පටිගත කරන ලද වැඩසටහන් ආකාරයට. නමුත් සජීවි වැඩසටහන් ඉදිරිපත් කිරීමේ අවස්ථාව ලද පළමු ළමා ශිල්පී කණ්ඩායම අප වූ අතර අප ඒ අභියෝගය ජයගත් නිසා පසුකලෙක ජ්‍යෙෂ්ඨ ගුවන් විදුලි ශිල්පීන් ලෙස ස්ථාවර විමේදී ඒ පුහුණුව විශාල පිටුවහලක් වුණා. ඊට අමතරව ගුවන් විදුලි නාට්‍ය ශිල්පීන් ලෙස සහ හඬ කැවීම් ශිල්පීන් ලෙස ළමා පිටියේදී ලද විධිමත් පුහුණුව පසු කළෙක මාධ්‍යවේදීන් ලෙස ඉදිරි ගමනක් යෑමේදී විශාල පන්නරයක් වුණා.
මේ අවධිය වනවිට පෞද්ගලික මාධ්‍ය ආයතන බිහිවිමත් සමඟ ශ්‍රාවකයින්ගේ රුචිකත්වය වෙනතකට හැරීම පිළිබඳව රටේ බුද්ධිමතුන් විශාල මතවාදයක් පුවත්පත් හරහා ඇතිකරමින් සිටියා. එනිසා සම්ප්‍රදායික ගුවන් විදුලි මාධ්‍ය කලාවත් සෝෂාකාරි මාධ්‍ය කලාවත් යන ද්විත්වයෙන්ම වියුක්ත වූ මැද මාවතේ එහෙත් ප්‍රශස්ත මට්ටමේ ගුවන් විදුලි සේවාවක් රජයට අනුබද්ධව ගොඩනැගීමේ අවශ්‍යතාවක් මතුවුණා. මේ නිසා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පරිශ්‍රයේම එක්තරා කොටසක ලක්හඬ ගුවන්විදුලි සේවය ආරම්භ කළා.

ඒ වන විට මා ජීව විද්‍යා අංශයෙන් උසස්පෙළ විභාගයට පෙනී සිට ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් රැඳී සිටියා. අලුතින් ආරම්භ කළ ලක්හඬ ගුවන් විදුලියට විශ්ව විද්‍යාල වලින් පිටවූ නැවුම් උපාධිධාරින්ව බඳවා ගත්තත් ඔවුන්ට ගුවන් විදුලි කලාව පිළිබඳව තිබූ අත්දැකීම් මඳකම නිසා ළමා පිටියේ සිටි ජ්‍යෂඨ ශිල්පීන් වූ අපට නව ගුවන් විදුලි සේවය සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන්නැයි ආරාධනා ලැබුණා.ඒ අනුව මා ප්‍රථම වරට ළමා පිටියෙන් පසුව වෘත්තීය මාධ්‍යවේදිනියක් ලෙස "ලක්හඬ" (වර්ථමානය වන විට මෙය ෂඹහ පෙ බවට පත් වී ඇත.) ගුවන් විදුලියට සම්බන්ධ වූයේ.එහෙත් ඒ අතරවාරයේම ඒ වනවිට ළමා පිටියේ සිටි කණිෂ්ඨ ශිල්පීන්ට සජීව වැඩසටහන් ඉදිරිපත් කිරීමට දිරිදීම වෙනුවෙන් සජීවිව ළමා පිටිය ඉදිරිපත් කිරීම සඳහාද වරින්වර අපව කැඳවනු ලැබුවා. සජීවි ළමා පිටියත් සජීව ලක්හඬ මැදිරියේත් නිතර දක්නට ලැබෙන ගුවන් විදුලි චරිත බවට අප පරිවර්තනය වුණා.එය නැවත නැවතත් සිහිපත් කරමින් රසවිඳිය හැකි මිහිරි අතීතයක්.

එසේම වසර 2000දී ලක්හඬ ගුවන් විදුලිය ස්වාධීන රූපවාහිනී ආයතනයේ සහෝදර ගුවන් විදුලි නාලිකාව බවට පත්වෙමින් එතෙක් විකාශන කටයුතු සිදු කළ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පරිශ්‍රයෙන් මිදී බත්තරමුල්ලේ පිහිටි ස්වාධීන රූපවාහිනී පරිශ්‍රයට පැමිණියා.එතැන් පටන් මා වෙත විවිධ අවස්ථා වලදී ස්වාධීන රූපවාහිනී සේවයේ වැඩසටහන් ඉදිරිපත් කිරීමේ වරමත් හිමිවුණා.සිංහල අවුරුදු සමයේ ගමින් ගමට ගොස් සිදුකරන අවුරුදු චාරිත්‍ර වැඩසටහන්, " ගැහැණිය" නම් වූ කාන්තා වැඩසටහන සහ ගංවතුර හා සුනාමි ඛෙදවාචකය සිදුවූ අවධියේ විකාශනය කල රූපවාහිනී වැඩසටහන් වලටත් සම්බන්ධ විමට මට අවස්ථාව ලැබුණා.එකල Super hits නමින් සංගීත ශිල්පීන් සමඟ මා ඉදිරිපත් කළ රූපවාහිනී වැඩසටහන ඉතා ජනප්‍රිය වැඩසටහනක් බවට පත්ව තිබුණා. කෙටි කාලයක් මා රූපවාහිනී ප්‍රවෘත්ති නිවේදිකාවක් ලෙසත් කටයුතු කළා. මේ අනුව ගුවන් විදුලි මෙන්ම රූපවාහිනී නිවේදනයට සම්බන්ධ වෙමින් මාධ්‍ය දෙකම පරිශීලනය කළ අයෙකු බවට මා පත්වූවා. ඒ ලැබුණු අත්දැකීම් සම්භාරය අද නෙ-ාරටක ජීවත්වෙමින් පවා මාධ්‍යලෝකය තුළ විනයගරුකව ඉදිරි ගමනක් යෑමට අවශ්‍ය සියළුම ශක්තිය මා තුළ ගොඩනැගීමට ඉවහල් වුණා.

සන්නසඃ
මාධ්‍යවේදිණියක ලෙස ශ්‍රීලංකාව තුළ විශාල සේවයක් ඉටුකරමින් සිටියදී හදිසියේ සියල්ල අතහැර විදෙස් ගතවන්නට ඔබ තීරණය කළේ කුමන හේතුවක් මත පිහිටාද?
දිල්රුක්ෂිඃ
බලයට පත්වන රජයන් වල යම් යම් න්‍යායයන් සමඟ එකඟ විමට රජයේ මාධ්‍ය ආයතන වලට සිදුවනවා. එය ශ්‍රී ලංකාව තුළ රජයේ මාධ්‍ය ආයතන වල සේවය කළ මාධ්‍යවේදින්ට අත්විඳින්නට ලැබෙන සාමාන්‍ය තත්ත්වයක්. එවැනි බලපෑම් එකළ මා තුළ විශාල පීඩනයක් සහ කලකිරීමක් ඇතිකළා. ආණ්ඩු මාරුවෙන හැම අවස්ථාවකම ලක්හඬ සහ ස්වාධීන රූපවාහිනී සේවය යන නාලිකා දෙකෙහිම ඉහළ පාලනාධිකාරියට පැමිණෙන දේශපාලන පත්වීම් හරහා ආයතනය තුළ ක්‍රියාත්මක වුණු නිලධාරිවාදය ස්වාධීන වැඩසටහන් නිෂ්පාදනයට යම් ආකාරයකින් බලපෑම් ඇතිකළා. ආයතනය තුළ ක්‍රියාත්මක උසස්වීම් පටිපාටියටද බලපෑම් වන අයුරින් දේශපාලන අතපෙවීම් සිදුවීම හේතුවෙන් බොහෝ මාධ්‍යවේදීන්ට උසස්වීම් ලබාගැනීමට නම් දේශපාලන ගැත්තෙක් බවට පත්වන්නට සිදුවීම ආරම්භ වුණා. මෙය මා තදින් පිළිකුල් කළ දෙයක්. මා කවදත් දේශපාලනයට නතුවුණ අයෙක් නොවෙයි. මා සැමවිටම මගේ වෘත්තීය නිදහස අගය කළ කෙනෙක්.හැබැයි මා ලක්හඬ ගුවන් විදුලියේ බොහෝ දේශපාලන වැඩසටහන් වලට නිෂ-ාපාදනයෙන් සහ නිවේදනයෙන් සම්බන්ධව සිටි අයෙක්.ඒත් දේශපාලන පාක්ෂික භාවය මා තුළ නැහැ. ජනතාවට තොරතුරු ලබාදීමේ කාර්යයයේදී මට පාට පක්ෂ වැදගත් නැහැ. ඒ කාලයේ මා විසින් ඉදිරිපත් කරන ලද සහ නිෂ්පාදනය කරන ලද දේශපාලන සහ සමාජය විනිවිද දැකිය හැකි ඇතැම් ගුවන්විදුලි වැඩසටහන් වලට එල්ල වුණු බාධා හමුවේ මට හිතුනා ටික කලකට මාධ්‍යයෙන් බැහැරව විදේශ රටක ජීවන අත්දැකීම ලබාගැනීමට දැන් කාලය හරි කියා. එකල මා ගත් එම තීරණයට බොහෝ අය විමතිය පළ කළා. මොකද මා ඒ වන විට මාධ්‍යයට සම්බන්ධ විවිධ අංශ වලින් මගේ සේවා ස්ථානය තුළ පමණක් නොව තවත් මාධ්‍ය ආයතන ගණනාවකට ගුවන්විදුලි නාට්‍ය ශිල්පිණියක් සහ රූපවාහිනී හඬකැවීම් ශිල්පිණියක් ලෙසින් දායකත්වය ලබාදෙමින් සිටියා. සිරස මාධ්‍ය ආයතනය, නෙත් ඵ්ල හිරු ඵ්ල ශ්‍රී ලංකා ගුවන් විදුලිය, රන්ගිරි දඹුලු FM ආදී මාධ්‍ය ආයතන වල මා රූපවාහිනී හඬ කැවීම් ශිල්පිණියක් සහ ගුවන් විදුලි නාට්‍ය ශිල්පිණියක් ලෙසින් මා සම්බන්ධ වී සිටියා. එකල මාධ්‍ය ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨයින් සහ මාධ්‍ය හිතවතුන් මගේ තීරණයට විරෝධය පලකරමින් මාධ්‍ය ජීවිතය හැර නොයන ලෙසට ඉල්ලා සිටියත් විදේශ ගතවීමේ සිහිනය හිතට පිවිසියාට පසුව එය සැබෑකර ගැනීමේ මහත් නොඉවසිල්ලක් මා හට ඇතිවුණා.එම සිතිවිල්ල මගේ සිතට එක්වරම පිවිසි ආකාරයත් හරිම පුදුමාකාරයි. එක්තරා හැන්දෑවක මා බත්තරමුල්ලේ පිහිටි ලක්හඬ ගුවන්විදුලි ආයතනයේ විවේකාගාරයේ අසුන්ගෙන තේ කෝප්පයක රසවිඳිමින් සිටියා. ඒ අසල වියළී පත්‍ර බිම වැටෙමින් තිබූ රූස්ස ගස වෙත මගේ අවධානය යොමු වුණා. ඒ දෙස බලා සිටියදී එක්වනම මගේ සිතට පිවිසියේ මේ ගසේ පත්‍ර සියල්ල වියළී පොළවට පතිත විමට පෙර කිසියම් විදේශ රටකට ගොස් කෙටි කාලයක් හෝ එම ජීවිත අත්දැකීම ලබා ගැනීමේ සුදුසුම කාලය මේ බවයි. ඒ අනුව ඔස්ට්‍රේලියාවට පැමිණි පසු පළමු මාස කිහිපය තද හුදකලාවක් සහ හිස් බවක් දැනුනත් මෙරට තුළ තිබූ මානසික නිදහස ක්‍රමයෙන් මගේ සිත ඇදගන්නට පටන් ගත්තා. නමුත් දශකයක් ඉක්මවූ කාලයක් ගුවන් විදුලි මාධ්‍ය තුළ සැරිසැරූ මට ඒ ගුවන් විදුලි අත්දැකීම් නිතර සිහිපත් වුණා. ඒ හිස් බව මකා ගැනීමේ අරමුණින් ඒ වන විට ඔස්ට්‍රේලියාවේ ආරම්භ වී තිබූ ප්‍රජා ගුවන්විදුලි සේවාවන් වන තුන්මංසල වෙබ් ගුවන් විදුලියටත්, ලක්හඬ නමින් තිබූ ගුවන් විදුලි සේවයටත් සිංහලෙන් පැය දෙකක් නමින් විකාශය වූ ගුවන් විදුලි සේවයටත් වැඩසටහන් ඉදිරිපත් කිරීම, ප්‍රවෘත්ති නිවේදනය ආදී විවිධ අංශ ඔස්සේ මගේ සම්පත් දායකත්වය ලබාදුන්නා. තිර පිටපත් සකස් කිරීම, ප්‍රවෘත්ති නිවේදනය, වෙළඳ දැන්වීම් හඬ කැවීම ඇතුළු සියළුම කටයුතු සඳහා මගේ දායකත්වය සහ උපකාරය මා නොඅඩුව ඔවුන් වෙත ලබා දුන්නා.

නමුත් ඒ සියළු ප්‍රජා නාලිකා වලට සේවය ලබාදුන්නේ ස්වේච්ඡාවෙන්. ඇත්තටම ඔස්ට්‍රේලියාවේ ප්‍රජා නාලිකා වල සේවය කිරීම ස්වෙච්ඡා කටයුත්තක්. නමුත් ඉන් මට ලැබුණු තෘප්තිය මා අගය කරනවා. එසේම නැවතත් මගේ මාධ්‍ය හැකියාවන් අලුත් කරගැනීමට ලැබුණු අවස්ථාව ඉතාමත් වටිනවා. හැබැයි මා වෘත්තීමය වශයෙන් පූර්ණකාලීන රැකියාවක් ලෙසින් තමයි SBS මාධ්‍ය ආයතනයට 2013 වසරේදී සම්බන්ධ වන්නේ. ඊට පෙර මා ඔස්ට්‍රේලියාවේ මානව සේවා දෙපාර්තමේන්තුවට අනුබද්ධිත (Department of Human Services) රාජ්‍ය ආයතනයක සමාජ සංවර්ධන නිලධාරිනි යක ලෙසින් පූර්ණ කාලීනව රැකියාවේ නියුක්තව සිටියා.

එහෙත් කවදා හෝ SBS මාධ්‍ය ආයතනයට සම්බන්ධ විමේ බලාපොරොත්තුවෙන් මා ඒ වන විට පසුවුණා. මොකද SBS මාධ්‍ය ආයතනය තමයි බහුසංස්කෘතික පසුබිමක් සහිත අයවලුනට සම්බන්ධ විය හැකි ඔස්ට්‍රේලියාවේ පවතින එකම රාජ්‍ය මාධ්‍ය ආයතනය. එසේම ලංකාවේදී මා ලද මාධ්‍ය වෘත්තිය මෙරට තුළදිත් ලබාගැනීමේ ලොකු අපේක්ෂාවක් මා තුළ තිබුණා. කුඩා කල සිටම ගුවන් විදුලි ළමා ශිල්පියෙක් ලෙසට ඇරඹුනු මගේ ළමා කාලය ගතවූයේ ගුවන් විදුලි මැදිරි තුළ.ඉන්පසුව මගේ පලමු සහ අවසන් රැකියාවද වුණු මාධ්‍යවේදිනියක් ලෙස ලංකාවේ ගතකල ජීවිතයද ගෙවී ගියේ ගුවන් විදුලි මැදිරි තුළ. ඉතිං ඔස්ට්‍රේලියාවට පැමිණි පසුද මගේ දෛවය විසින් නැවතත් මගේ පෙර වෘත්තිය ජීවිතයම මට හිමිකරදෙමින් මා ගුවන් විදුලි මැදිරි අතරම රැඳවනවා .ඇත්තෙන්ම එය කලාතුරකින් කෙනෙකුට ලැබෙන විරල අවස්ථාවක්.මා ගුවන් විදුලිය වෙනුවෙන්ම උපන් ගුවන් විදුලි දරුවෙක් කියායි මට හිතෙන්නේ.

සන්නසඃ
ඔබ SBS ගුවන් විදුලියේ සිංහල අංශය භාර ගැනීමත් සමඟ එහි සංයුතිය තුළ ඇතිකළ විශේෂ වෙනස් කම් මොනවාද?
දිල්රුක්ෂිඃ
මා කළ ප්‍රථම කාර්යය වන්නේ ජාතික නාලිකාවක සහ ප්‍රජා ගුවන් විදුලියක ඇති වෙනස හඳුනා ගැනීම. ඒ අනුව වැඩසටහන් වල අන්තර්ගතය මා විසින් වෙනස් කරනු ලැබුවා. ඔස්ට්‍රේලියාව තුළ සිදුවන ප්‍රවෘත්ති සහ කාලීන සිදුවීම් වලට මුල්තැන ලබාදීම මා ආරම්භ කළා. අප සංක්‍රමණික ප්‍රජාවක් ලෙස මේ රටට පැමිණ ජීවත් විමේදී මෙරට සිදුවන දෑ පිළිබඳවත් යම් සවිඥානික බවක් ශ්‍රාවකයා තුළ තිබිය යුතුයි කියා මා විශ්වාස කරනවා.අප යම් විදේශ රටක ජීවත් විමේදී මවුරට පිළිබඳව තිබෙන සංවේදීතාවය වැඩියි.නමුත් ඒ සඳහා අද වන විට ඕනෑ තරම් අන්තර්ජාල මාධ්‍ය තිබෙනවා තොරතුරු දැන ගැනීමට. නමුත් අප මේ පය ගසා සිටින දේශයේ සිදුවන්නේ මොනවාද යන්න පිළිබඳව සිංහල භාෂාවෙන් තොරතුරු සම්ප්‍රේෂණය කිරීමේ කාලීන අවශ්‍යතාවයක් පවතින බව වටහාගත් නිසා,වැඩසටහනට,මෙරට සිදුවන ප්‍රවෘත්ති සහ කාලීන විශේෂාංගයක් ඇතුළත් විම අනිවාර්ය කිරීමට මා වෙහෙසුනා.

ඒ අනුව SBS සිංහල වැඩසටහනෙන් දිනපතාම ඔස්ට්‍රේලියාව තුළ සිදුවන දේශපාලනික තොරතුරු, පාර්ලිමේන්තුව තුළ සම්මත වන විශේෂ පනත්, මැතිවරණ, අධ්‍යාපන - ළමා හා වැඩිහිටි දීමනා ආදී සියළුම කරුණු පිළිබඳව එදිනෙදා මතුවන කාලීන අවශ්‍යතාව අනුව කෙටි විශේෂාංගයක් වැඩසටහනට ඇතුළත් වනවා. දෛනික ප්‍රවෘත්ති ප්‍රකාශය තුළද මා මේ වෙනස සිදුකළා. ආරම්භයේදී මෙය අභියෝගාත්මක වුවත් පසුව ශ්‍රාවක පිරිස් ඔස්ට්‍රේලියාවේ තතු විත්ති දැනගැනීමට අප ප්‍රවෘත්ති ප්‍රකාශය නොකඩවා සවන් දෙන තත්ත්වයට පත්වූවා. ප්‍රවෘත්ති සහ කාලීන සිදුවීම් වලට අමතරව සතියකට වරක් විකාශනය වන විශේෂාංග ආරම්භ කිරීමට මා ක්‍රියා කළා. සතියේ ශ්‍රී ලාංකීය පුවත් විමසුම, සතියේ ක්‍රීඩා විග්‍රහය, ලොව වටා-සතියේ විදෙස් විත්ති සමාලෝචනය ආදී සතිපතා විශේෂාංග හරහා ඔස්ට්‍රේලියාවේත් ශ්‍රී ලංකාව සහ ලෝකයේ තොරතුරුත් සමීප කරවනවා. එසේම අපට තිබෙන කාලය ඉතා සීමිතයි. දවසකට පැයක් යනු ඉතා ඉක්මනින් ගතවන කාලයක්.මේ පැයක කාලය තුළ ප්‍රවෘත්ති ප්‍රකාශයද ඇතුළුව විශේෂාංග පහක් ඇතුළත් කිරීමට මා කටයුතු කළා. එය අභියෝගාත්මක කාර්යයක්. ඒත් රසවින්දනාත්මක වැඩසටහන්ද යම් ආකාරයකට ඇතුළත් විය යුතු නිසා මාසික විශේෂාංග වලින් කලාව පිළිබඳවත් එයට සම්බන්ධ වන ඔස්ට්‍රේලියාවේ සිංහල ප්‍රජාවේ හැකියාවත් ඉදිරියට ගෙන ඒමත් මගේ මූලික අභිලාෂය වුණා.

28 වන පිටට

**සන්නස වෙනුවෙන්
සාකච්ඡා කර සම්පාදනය කළේ
උපේක්ෂා
සේනානායක**